# DEMAND, SUPPLY, ELASTICITY AND MARKET EQUILIBRIUM (Part-IV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>මිල ඉල්ලුම් නම්‍යතා තීරක</u>

වෙළෙඳපොළේ භාණ්ඩයෙන් භාණ්ඩයට මිල ඉල්ලුම් නම්‍යතාව වෙනස් වේ. ඒ අනුව සමහර භාණ්ඩ සඳහා අනම්‍ය ඉල්ලුමක් ද *(Ed <1)* සමහර භාණ්ඩවලට නම්‍ය ඉල්ලුමක් ද *(Ed <1)* ඇති වේ.

මෙසේ භාණ්ඩයකට ඇති ඉල්ලුම අනම්‍ය බව නම්‍ය බව තීරණය කරන සාධක මිල ඉල්ලුම් නම්‍යතා තීරක ලෙස හැදින්වේ.

ClassWork.LK

# <u>මිල ඉල්ලුම් නම්‍යතා තීරක</u>

- සලකා බලන භාණ්ඩයක සුබෝපභෝගි බව හෝ අත්‍යවශ්‍ය බව

- භාණ්ඩයකට ඇති ආදේශක සංඛ්‍යාව හා ඒවායේ සමීප බව

- පාරිභෝගික ආදායමෙන් භාණ්ඩය මිල දී ගැනීමට වැය කරන ප්‍රමාණය

- භාණ්ඩයක ඇති විකල්ප භාවිත සංඛ්‍යාව

- මිල වෙනස් වීම හේතුවෙන් එයට හැඩ ගැසීමට ගත වන කාලය


ClassWork.LK

# මිල ඉල්ලුම් නම්‍යතාව හා පාරිභෝගික පැහැදම/ ව්‍යාපාරික අයභාරය අතර සම්බන්ධතාවය

මිල ඉල්ලුම් නම්‍යතාව දී ඇති විටෙක අදාළ භාණ්ඩයේ මිල වෙනස් වීම මත පාරිභෝගික පැහැදම වෙනස් වන ආකාරය නිශ්චය කළ හැකි ය.

මිල ඉල්ලුම් නම්‍යතාව හා පාරිභෝගික පැහැදම/ ව්‍යාපාරික අයභාරය අතර සම්බන්ධතාවක් පවතී. එය ප්‍රස්තාර සටහනකින් පහත පරිදි දැක්විය හැකි ය.

ClassWorkLK



ClassWork.LK

ඉහත ප්‍රස්තාරයට අනුව නම්‍ය ඉල්ලුම් ප්‍රදේශයේ දී මිල පහළ යන විට ව්‍යාපාරික අයභාරය ඉහළ යයි.

ඒකීය නම්‍ය ලක්ෂ්‍යයේ දී ව්‍යාපාරික අයභාරය උපරිම වෙයි.

අනම්‍ය ඉල්ලුම් ප්‍රදේශයේ දී මිල පහළ යන විට ව්‍යාපාරික අයභාරය පහළ යයි.

## ඉල්ලුම් නම්‍යතාව සහා පාරිභෝගික පැහැදම අතර පවතින සම්බන්ධතාව වගුවකින් දැක්වීම

| නම්‍යතාව | නම්‍යතා සංගුණකයේ අගය | මිල වෙනස් වීම | පාරිභෝගික පැහැදම/ ව්‍යාපාරික අයභාරය |
|---|---|---|---|
| අපරිමිත නම්‍යතාව | $PEd = x$ | ඉහළ යාම<br>පහළ යාම | ශූන්‍ය වේ<br>බලපෑම අපරිමිත වේ |
| නම්‍ය | $PEd > x$ | ඉහළ යාම<br>පහළ යාම | පහත වැටේ<br>ඉහළ යයි |
| ඒකීය | $PEd = 1$ | ඉහළ යාම<br>පහළ යාම | වෙනස් නොවේ<br>වෙනස් නොවේ |
| අනම්‍ය | $PEd < x$ | ඉහළ යාම<br>පහළ යාම | ඉහළ යාම<br>පහළ යාම |
| ශූන්‍ය ( පූර්ණ අනම්‍ය ) | $PEd = 0$ | ඉහළ යාම<br>පහළ යාම | ඉහළ යාම<br>පහළ යාම |

ClassWork.LK

# මිල ඉල්ලුම් නම්‍යතාව ප්‍රායෝගික ව වැදගත් වන අවස්ථා

පාරිභෝගිකයන්ට, නිෂ්පාදකයාට හා ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයනට තීරණ ගැනීම සඳහා නම්‍යතා සංකල්පය වැදගත් වේ.

භාණ්ඩයක මිල වැඩි / අඩු වන විට පාරිභෝගික පැහැදම / නිෂ්පාදන අයභාරයට කෙරෙන බලපෑම ප්‍රරෝකථනය කළ හැකි වීම.

ආදායම උපරිම කෙරෙන අවස්ථාවක සහ නිමැවුම සඳහා තීරණය කළ හැකි වීම

ව්‍යාපාර ආයතනයකට ඇති ඒකාධිකාරි ශක්තිය නිශ්චය කළ හැකි වීම

ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා භාවිත කළ හැකි වීම

වක්‍ර බදු පැනවීමේ දී අදාළ භාණ්ඩ තෝරා ගැනීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura